# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2048/46 - 2017 දෙසැම්බර් මස 08 වැනි සිකුරාදා - 2017.12.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 21/78 (xvi)

### 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24 (අ) වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 18 වැනි වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදනු ලබන නියමාවලිය.

ලේකම්,
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

2017 දෙසැම්බර් මස 06 වැනි දින,
කොළඹ දී ය.

*නියමාවලිය*

01. මෙම නියමාවලිය 2017 අංක 05 දරන දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය 2017.12.06 වැනි දින සිට ක්‍රියාත්මක වන්නේ ය.

02. මෙම නියමාවලිය 2017 අංක 2031/38 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ, 1978 අංක 16, දරන විශ්වවිද්‍යාල පනතේ 24 අ (1) වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ නියමයක් මගින් පිහිටවනු ලැබූ (මෙහි මින්මතු '' ආයතනය'' යනුවෙන් සඳහන් කරනු ලබන) දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

03. මෙම ආයතනය, (මෙහි මින්මතු '' විශ්වවිද්‍යාලය'' යනුවෙන් සඳහන් කරනු ලබන) කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධ වන්නේ ය.

04. පනතේ විධිවිධානවලට සහ යම් උචිත සාධන පත්‍රයකට සහ ( මෙහි මින්මතු ''කොමිෂන් සභාව'' යනුවෙන් සඳහන් කරනු ලබන) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ බලතල, කාර්ය හා කර්තව්‍යයන්ට යටත් ව ආයතනයට -

1A - PG 3808- 107 (2017/12)
*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

(අ) ශිෂ්‍යයන් ඇතුළත් කර ගැනීම ;

(ආ) ආයතනයේ සහ විශ්වවිද්‍යාලයේ නිර්දේශය මත කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබිය හැකි පරිදි ආයුර්වේද, සිද්ධ සහ යුනානි වෛද්‍ය ක්‍රමවල විශේෂඥ ක්ෂේත්‍රවල පශ්චාත් උපාධි ඉගැන්වීම්, පුහුණු කිරීම් සහ පර්යේෂණ සඳහා පහසුකම් සැලැස්වීම ;

(ඇ) විශ්වවිද්‍යාලයේ අනුමැතිය සහ කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව, ආයුර්වේද, සිද්ධ සහ යුනානි වෛද්‍ය ක්‍රමවල විවිධ විශේෂඥ ක්ෂේත්‍රවල හෝ අදළ විශේෂඥ ක්ෂේත්‍රවල ප්‍රදනය කළ යුතු පශ්චාත් උපාධි, පශ්චාත් උපාධි අභිඥන පත්‍ර, පශ්චාත් උපාධි සහතික පත්‍ර සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා නිශ්චය කිරීම;

(ඈ) විශ්වවිද්‍යාලයේ අනුමැතිය ඇතිව, ආයුර්වේද, සිද්ධ සහ යුනානි වෛද්‍ය විද්‍යාවේ විවිධ විශේෂඥ ක්ෂේත්‍රවල හෝ අදළ විශේෂඥ ක්ෂේත්‍රවල ප්‍රවීණතාව අත්පත් කරගත් තැනැත්තන් නිර්ණය කර ගැනීමේ අරමුණ සඳහා පශ්චාත් උපාධි විභාග පැවැත්වීම සහ විභාගවලින් සමත් වන්නා වූ ද, ආයතනය විමසා, අතුරු ව්‍යවස්ථාව මඟින් නිර්දිෂ්ට කළ හැකි අනෙකුත් එවන් කොන්දේසි සම්පූර්ණ කරන්නා වූ ද, විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි, පශ්චාත් උපාධි අභිඥන පත්‍ර, පශ්චාත් උපාධි සහතික පත්‍ර සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා පිරිනමනු ලැබීමට සුදුසුකම් ලබන්නා වූ ද තැනැත්තන් පිළිබඳව විශ්වවිද්‍යාලයට නිර්දේශ කිරීම;

(ඉ) ආයතනයේ අරමුණුවලට සමාන වන්නා වූ හෝ ඒවාට බොහෝ සෙයින් සමාන වන්නා වූ අරමුණු ඇති, ශ්‍රී ලංකාවේ හෝ ඉන් පිටත විශ්වවිද්‍යාල හෝ ආයතන සමඟ ගුරුවරුන්, ශිෂ්‍යයන් සහ ශාස්ත්‍රවේදීන් හෝ අන්‍යාකාරයෙන් හුවමාරු කර ගැනීම මඟින් එම ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම;

(ඊ) අතුරු ව්‍යවස්ථාවකින් නියම කරනු ලැබිය හැකි පරිදි, ආයතනයට ඇතුල්වීමට අපේක්ෂා කරන තැනැත්තන් හෝ ආයතනයේ ශිෂ්‍යයන් විශ්වවිද්‍යාලවල දී හෝ විශ්වවිද්‍යාල තත්ත්වයේ අධ්‍යාපන ආයතනවල දී සාමාර්ථ්‍යලත් විභාග හා ගත කළ අධ්‍යයන කාල සීමාව ආයතනයේ එවැනි විභාගවලට හා එවැනි අධ්‍යයන කාල සීමාවලට හෝ ඉන් යම් කොටසකට සමාන ලෙස පිළිගැනීම හා ඕනෑම අවස්ථාවක ඒ පිළිගැනීම ඉවත් කර ගැනීම;

(උ) ආයතනයේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි මහාචාර්ය ධූර. සහාය මහාචාර්ය ධූර, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ධූර, කථිකාචාර්ය ධූර හා වෙනත් තනතුරු ඇති කිරීම, අවලංගු කිරීම හෝ අත්හිටුවීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයට නිර්දේශ කිරීම;

(ඌ) ආයතනයේ ඉගැන්වීමේ, පුහුණු කිරීමේ හෝ පර්යේෂණ කිරීමේ කාර්යය සඳහා වන පුස්තකාල, රසායනාගාර හා වෙනත් ගොඩනැගිලි ඉදි කිරීම, ඒවාට උපකරණ සැපයීම හා ඒවා පවත්වාගෙන යාම;

(එ) විශ්වවිද්‍යාලය විමසා අධිශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, පදක්කම් හා වෙනත් ත්‍යාග ප්‍රදනය කිරීම;

(ඒ) පර්යේෂණ හා පාඨමාලා හෝ පාඨමාලාවල කොටස් විශ්වවිද්‍යාලයෙන් හා ආයතනයෙන් බාහිර වූ ස්ථානවල පැවැත්වීමට කටයුතු, ඒ සඳහා විධිවිධාන සලස්වන යම් අතුරු ව්‍යවස්ථාවක් අනුව පිළියෙල කිරීම;

(ඔ) විශ්වවිද්‍යාලයේ එකඟත්වය ඇතිව, ආයතනය විසින් අනුමත කළ හැකි තැනැත්තන් ආයතනයේ පුහුණුකරුවන් සහ පරීක්ෂකවරුන් ලෙසින් පිළිගැනීම;

(ඕ) ගාස්තු ඉල්ලීම හා භාර ගැනීම සඳහා විධිවිධාන සලස්වන යම් රීතියක් අනුව ගාස්තු ඉල්ලීම හා භාර ගැනීම; සහ

(ක) ආයතනයේ පරමාර්ථ ඉටු කර ගැනීම පිණිස අවශ්‍ය විය හැකි ඉහත සඳහන් බලතල, කාර්යයන් හා කර්තව්‍යවලට ආනුෂංගික වූ හෝ ඒ හේතුවෙන් අවශ්‍ය වෙනත් සියලු ක්‍රියා හා දේ කිරීම;

සඳහා බලය තිබිය යුතු ය.

5. ආයතනයේ නිලධරයන් පහත පරිදි විය යුතු ය.

(අ) අධ්‍යක්ෂවරයා ; සහ

(ආ) වෙනත් යම් තනතුරක් දරන තැනැත්තකු මේ ඡේදයේ කාර්ය සඳහා නිලධරයකු බව නියමාවලිය මඟින් ප්‍රකාශ කරනු ලැබ ඇත්තේ ද, එකී තනතුරක් දරන තැනැත්තකු.

6. (1) කොමිෂන් සභාව විසින් ප්‍රථම අධ්‍යක්ෂවරයා තෝරා පත් කරනු ලැබිය යුතු ය.

(2) පසුව පත්වන සෑම අධ්‍යක්ෂවරයකු ම, (මෙහි මින්මතු " මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) ආයතනයේ කළමනාකරණ මණ්ඩලය විසින් නිර්දේශ කරනු ලබන තැනැත්තන් තිදෙනෙකුගෙන් යුත් මූල මණ්ඩලයක් අතරින් කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබිය යුතු ය. යම් උසස් අධ්‍යාපන ආයතනයක හෝ උසස් අධ්‍යාපන විද්‍යායතනයක කාර්ය මණ්ඩලයක සාමාජිකයකු, අධ්‍යක්ෂවරයකු වශයෙන් තෝරා පත් කරනු ලබන අවස්ථාවක දී, එසේ තෝරා පත් කරගනු ලැබූ එම කාර්ය මණ්ඩල සාමාජිකයා, අධ්‍යක්ෂ තනතුර භාර ගැනීම සඳහා ඒ ආයතනය හෝ විද්‍යායතනය විසින් මුදා හැරිය යුතු ය.

එසේ වුවද, කිසිම තැනැත්තකු අනුක්‍රමික ධූර කාල දෙකකට වඩා ආයතනයේ අධ්‍යක්ෂවරයා ලෙස පත් කරනු නොලැබිය යුතු ය.

(3) ආයතනයේ අධ්‍යක්ෂවරයා කලින් ධූරය අත්හැරියහොත් මිස, හෝ (4) වන අනුඡේදය යටතේ ධූරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, පත්කරනු ලැබූ දින සිට ගණන් බලනු ලබන වර්ෂ තුනක කාලසීමාවක් ගතවීම හෝ ඔහුගේ විශ්‍රාම ගැනීමේ වයස සම්පූර්ණ වීම යන මෙයින් කලින් එළඹෙන දිනය තෙක් ධූරය දරන්නේ ය.

(4) විශ්වාසභංග යෝජනාවක් සම්මත කර ගැනීම සඳහා කැඳවනු ලැබූ විශේෂ රැස්වීමක දී ඒ මණ්ඩලයේ මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට නොඅඩු සංඛ්‍යාවකගේ ඡන්දයෙන් සම්මත කරගනු ලබන විශ්වාසභංග යෝජනාවක් මත, කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් ධූරයෙන් ඉවත් කරනු ලැබිය යුතු ය. එකී විශේෂ රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන් විසින් ඔවුන් අතරින් අධ්‍යක්ෂවරයා හැර වෙනත් සාමාජිකයකු ඒ රැස්වීමේ මුලසුන දැරීම සඳහා තෝරා පත්කර ගත යුතු ය.

(5) ධූරයෙන් ඉල්ලා අස්වන හෝ ඉවත් කරනු ලබන හෝ තම නිල කාලය සම්පූර්ණ කරන්නා වූ අධ්‍යක්ෂවරයකු, අධ්‍යක්ෂවරයකු වශයෙන් පත්වීම ලැබීමට පූර්වයෙන් උසස් අධ්‍යාපන ආයතනයක හෝ උසස් අධ්‍යාපන විද්‍යායතනයක කාර්ය මණ්ඩලයේ සාමාජිකයකුව සිටියේ නම් සහ ඔහු කලින් දරූ තනතුරින් විශ්‍රාම ගැනීමේ වයසට එළැඹී නොමැති නම්, එකී උසස් අධ්‍යාපන ආයතනයේ හෝ උසස් අධ්‍යාපන විද්‍යායතනයේ ඔහුගේ නිත්‍ය තනතුරට ඔහු පෙරළා පැමිණිය හැකි ය.

(6) නිවාඩු පිට සිටීම, රෝගාතුර වීම, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනයම් හේතුවක් නිසා අධ්‍යක්ෂවරයාට ඔහුගේ ධූරයේ කාර්යය ඉටු කිරීමට තාවකාලිකව නොහැකිවන අවස්ථාවක, එසේ කාර්යය ඉටු කිරීමට නොහැකි වීමෙන් දින 7 ක් ඇතුළත, ඒ ධූරයේ කාර්යය ඉටු කිරීම සඳහා සුදුසු යැයි කොමිෂන් සභාව අදහස් කරන වැඩපිළිවෙළක් කොමිෂන් සභාව විසින් යෙදිය යුතු ය. එසේ වැඩපිළිවෙළක් යොදන තෙක් විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරිවරයා විසින් ඒ ධූරයේ එදිනෙද කාර්යය කරගෙන යා යුතු ය.

(7) අධ්‍යක්ෂ ධූරයේ යම් පුරප්පාඩුවක් ඇතිවන අවස්ථාවක, කොමිෂන් සභාව විසින් එම පුරප්පාඩුව ඇති වී දින 7 ක් ඇතුළත ස්ථිර පත්වීමක් සිදු කරනු ලබන තෙක් එම ධූරයේ කාර්යය ඉටු කිරීම සඳහා සුදුසු යැයි සලකනු ලබන වැඩපිළිවෙළක් සකස් කළ යුතු ය. එවැනි වැඩපිළිවෙළක් සකස් කරනු ලබන තෙක් විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරිවරයා විසින් එම ධූරයේ එදිනෙද කාර්යය ඉටු කළ යුතු ය.

7. (1) අධ්‍යක්ෂවරයා, ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයා සහ ප්‍රධාන ශාස්ත්‍රීය නිලධරයා වන්නේ ය. ඔහු නිල බලයෙන් මණ්ඩලයේ හා සෑම අධ්‍යයන මණ්ඩලයකම සාමාජිකයකු ද වන්නේ ය. ආයතනයේ වෙනයම් බල මණ්ඩලයක හෝ පුද්ගල මණ්ඩලයක රැස්වීමක් කැඳවීමට, ඒ රැස්වීමකට පැමිණ සිටීමට හා එහිදී කථා කිරීමට අධ්‍යක්ෂවරයාට හිමිකම් ඇති නමුදු, ඔහු ඒ බල මණ්ඩලයේ හෝ පුද්ගල මණ්ඩලයේ සාමාජිකයකු වන්නේ නම් මිස, එකී යම් රැස්වීමක දී ඡන්දය දීමට ඔහුට හිමිකම් නොමැති විය යුතු ය.

(2) සෑම අධ්‍යයන මණ්ඩලයක්ම සහ මණ්ඩලය විසින් තත්කාර්යය සඳහා නීත්‍යානුකූලව වරින් වර තමා වෙත නිකුත් කරනු ලැබිය හැකි විධානවලට අනුකූලව, නියමාවලියේ, පනතේ හෝ වෙනත් යම් උචිත සාධන පත්‍රයක විධිවිධාන ආයතනයට අදළ වන තාක් දුරට, ඒ විධිවිධාන යථා පරිදි පිළිපදින බවට වගබලා ගැනීම අධ්‍යක්ෂවරයාගේ කාර්යය වන්නේ ය. ඒ සඳහා මණ්ඩලයේ සහ සෑම අධ්‍යයන මණ්ඩලයකම තීරණවලට බලය ලබාදෙමින් ඒ කාර්යය සඳහා අවශ්‍ය යැයි ඔහු විසින් සලකනු ලබන සියලු බලතල ඔහු විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

(3) මණ්ඩලයේ සහ සෑම අධ්‍යයන මණ්ඩලයකම තීරණ ක්‍රියාත්මක කිරීමට සැලැස්වීම අධ්‍යක්ෂවරයාගේ කාර්යය විය යුතු ය.

(4) අධ්‍යක්ෂවරයා ආයතනයේ ගණන් තැබීමේ නිලධරයා වන්නේ ය.

(5) ආයතනය තුළ විනය පවත්වා ගැනීම පිළිබඳව අධ්‍යක්ෂවරයා වගකිව යුතු ය.

8. ආයතනය පහත සඳහන් බලමණ්ඩලවලින් සමන්විත විය යුතු ය.

(අ) මණ්ඩලය ;

(ආ) අධ්‍යයන මණ්ඩල ;

(ඇ) විශේෂඥ මණ්ඩල ;

(ඈ) එහි අධිකාරීන් ලෙස සලකනු ලැබිය යුතු නියමාවලිය මගින් නියම කරනු ලැබිය හැකි වෙනත් යම් පුද්ගල මණ්ඩල.

9. මණ්ඩලය, ආයතනයේ ශාස්ත්‍රීය හා විධායක මණ්ඩලය විය යුතු අතර, එය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

(1) පහත දැක්වෙන නිල බලයෙන් පත්වන සාමාජිකයින් -

(අ) අධ්‍යක්ෂවරයා;

(ආ) උසස් අධ්‍යාපන විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ එකී ලේකම්වරයාගේ නාමිකයකු;

(ඇ) දේශීය වෛද්‍ය විද්‍යාව විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහු විසින් නම් කළ තැනැත්තකු;

(ඈ) මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහු විසින් නම් කළ තැනැත්තකු;

(ඉ) ආයුර්වේද කොමසාරිස්වරයා;

(ඊ) ආයතනයේ හිටපු ආසන්නතම අවසාන අධ්‍යක්ෂවරයා;

(උ) පනත යටතේ ස්ථාපිත කොළඹ දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ සහ පනත යටතේ හඳුනාගැනෙන ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ අධ්‍යක්ෂවරු;

(ඌ) පනත යටතේ ස්ථාපිත කරන ලද යාපනය විශ්වවිද්‍යාලයේ සහ නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සිද්ධ වෛද්‍ය අංශවල ප්‍රධානීන්;

(එ) බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනයේ අධ්‍යක්ෂවරයා.

(2) පහත දැක්වෙන වෙනත් සාමාජිකයින් -

(අ) ආයුර්වේද දෙපාර්තමේන්තුවේ එක් එක් ආයුර්වේද. සිද්ධ සහ යුනානි වෛද්‍ය ක්‍රමවල විශේෂඥ ශ්‍රේණියේ වෛද්‍යවරුන් අතරින් ආයුර්වේද කොමසාරිස්වරයා විසින් තෝරා පත් කරනු ලබන එක් සාමාජිකයකු බැගින්;

(ආ) නීතිය, පරිපාලනය සහ මූල්‍ය යනාදී ක්ෂේත්‍රයන් හි විශිෂ්ඨ සේවයක් ඉටුකර ඇති තැනැත්තන් අතරින් කොමිෂන් සභාව විසින් පත් කරන සාමාජිකයින් සිව්දෙනෙකු;

(ඇ) විශ්වවිද්‍යාල පාලක සභාවට පත් කර ගන්නා ලද සාමාජිකයින් අතරින් පාලක සභාව විසින් නම් කරන ලද සාමාජිකයින් දෙදෙනෙකු.

10. (1) මණ්ඩලයේ සභාපතිවරයා, අධ්‍යක්ෂවරයා විය යුතු අතර, ඔහු මණ්ඩලයේ සියලුම රැස්වීම්වල මුලසුන දැරිය යුතු ය. මණ්ඩලයේ යම් රැස්වීමක මුලසුන දැරීමට සභාපතිවරයාට නොහැකිවන්නේ නම්, පැමිණ සිටි සාමාජිකයින් අතරින් යම් සාමාජිකයකු ඒ රැස්වීමේ මුලසුන දැරීම සඳහා තෝරා පත් කරගත යුතු ය.

(2) කලින් ධූරය අත්හැරියහොත් මිස, අවස්ථාවෝචිත පරිදි, යම් තෝරාපත් කරගනු ලැබූ හෝ තෝරා පත් කළ සාමාජිකයකු, ඔහු එසේ තෝරා පත් කරගනු ලැබූ හෝ පත් කරනු ලැබූ දින සිට අවුරුදු තුනක කාලයක් මණ්ඩලයේ සාමාජිකයකු ලෙස ධූරය දැරිය යුතු අතර, ධූරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, ඔහු නැවත තෝරාපත් කරනු ලැබීමට හෝ නැවත පත් කරනු ලැබීමට සුදුස්සකු වන්නේ ය.

එසේ වුවද, තෝරා පත්කරගනු ලැබූ හෝ පත් කරනු ලැබූ යම් සාමාජිකයකු, ඔහුගේ ධූර කාලය ඉකුත්වීමට ප්‍රථම ධූරය අත්හැර ගියහොත්, ඔහුගේ අනුප්‍රාප්තිකයා විසින් ඔහු ද කලින් ධූරය අත්හැර ගියහොත් මිස, ඔහුගේ පූර්වගාමියාගේ ධූර කාලයෙන් නොගෙවී ඉතිරිව තිබූ ධූර කාලය තුළ ධූරය දරන්නේ ය.

එසේම තවදුරටත්, යම් තෝරා පත් කරනු ලැබූ සෑම සාමාජිකයෙක් ම, මණ්ඩලයේ සාමාජිකයකු ලෙස තෝරා පත් කරනු ලැබුවේ යම් තරාතිරමක් හෝ සාමාජිකත්වයක් ප්‍රකාරව ද, ඒ තරාතිරම හෝ සාමාජිකත්වය දරන තාක්කල් ඔහු මණ්ඩලයේ සාමාජික ධූරය දරන්නේ ය.

(3) මණ්ඩලයේ තෝරා පත් කරනු ලැබූ සාමාජිකයකු විසින් තම අත්සන යටතේ අධ්‍යක්ෂවරයා අමතා යවන ලිඛිත ඉල්ලීමක් මගින් සාමාජික ධූරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(4) මණ්ඩලයේ පත් කරනු ලැබූ යම් සාමාජිකයකු විසින් තම අත්සන යටතේ කොමිෂන් සභාවේ සභාපතිවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් තම ධූරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(5) මණ්ඩලයේ යම් තෝරා පත් කරගනු ලැබූ හෝ පත්කරනු ලැබූ සාමාජිකයකු අවසර නොලබා මණ්ඩලයේ යම් අනුක්‍රමික රැස්වීම් තුනකට පැමිණීම පැහැර හැරියහොත් ඔහු මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් ධූරය අත්හැරියසේ සැලකිය යුතු අතර, ඒ හේතුවෙන් ඇතිවන පුරප්පාඩුව සඳහා කොමිෂන් සභාව විසින් යෝග්‍ය තැනැත්තකු පත් කළ යුතු ය.

(6) අමාත්‍යවරයා විසින් මුදල් විෂයයභාර අමාත්‍යවරයා විමසා නිශ්චය කරනු ලබන පාරිශ්‍රමිකයක් හෝ දීමනාවක් මණ්ඩලයේ සාමාජිකයින්ට ගෙවනු ලැබිය යුතු ය.

(7) මණ්ඩලයේ යම් රැස්වීමක් සඳහා සණපූරණය මණ්ඩලයේ මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකක් විය යුතු වේ.

(8) අවශ්‍ය වන කවර අවස්ථාවක වුව ද මණ්ඩලය රැස්විය යුතු ය. එසේ වුව ද එක් වර්ෂයක් තුළ මණ්ඩලය අට වාරයකට නොඅඩු වාර ගණනක් රැස්විය යුතු ය.

(9) මණ්ඩලයේ සභාපතිවරයා විසින් අවශ්‍ය යැයි සලකනු ලබන කවර හෝ අවස්ථාවක දී නැතහොත් මණ්ඩලයේ මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකක සාමාජික සංඛ්‍යාවක් විසින් ඉදිරිපත් කරනු ලබන ලියවිල්ලකින් වූ ඉල්ලීමක් සභාපතිවරයා වෙත ලැබී සතියක් ඇතුළත හෝ මණ්ඩලයේ විශේෂ රැස්වීමක් කැඳවිය යුතු ය.

11. (1) මේ පනතේ විධිවිධානවලට හා යම් උචිත සාධන පත්‍රයකට යටත්ව, මෙම නියමාවලිය මගින් ආයතනය වෙත ප්‍රදානය කරන ලද හෝ පවරන ලද නැතහොත් නියම කෙරෙන බලතල ක්‍රියාත්මක කිරීම සහ කාර්යය හා කර්තව්‍ය මණ්ඩලය විසින් ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කළ යුතු ය.

(2) පනතේ විධිවිධානවලට හා යම් උචිත සාධන පත්‍රයකට යටත්ව, ඉගැන්වීම, අධ්‍යාපනය, පර්යේෂණ හා විභාග පිළිබඳ පාලනය හා මෙහෙයවීම මණ්ඩලය සතු වන්නේ ය.

(3) (1) වන සහ (2) අනුඡේදවලින් මණ්ඩලයට පවරනු ලැබූ පොදු බලතලවලට අගතියක් නොමැතිව, පහත සඳහන් බලතල, කාර්යය හා කර්තව්‍ය මණ්ඩලය විසින් භාවිත කිරීම, ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කළ යුතු ය.

(අ) wdh; k f haf oafmd< i y wruq, aÿ u"md; k h l Ísu ydmßmd; k h l Ísu;

(ආ) මේ පනතේ සහ වෙනත් යම් උචිත සාධන පත්‍රයක විධිවිධානවලට අනුකූලව ආයතනය හා සම්බන්ධ සියලු කාරණා විධිමත් කිරීම හා නිශ්චය කිරීම;

(ඇ) ආයතනයේ සාමාන්‍ය පරිපාලනය සහ කළමනාකරණය සඳහා සහ වෙනත් යම් නිශ්චිත කාර්යයක් සඳහා ආයතනයට ලබා දෙන අරමුදල් පරිපාලනය කිරීම;

(ඈ) ආයතනයට අන්තිම කැමති පත්‍ර මගින්, පරිත්‍යාග මගින් හා වෙනත් ප්‍රදාන මගින් ලැබෙන චංචල හෝ නිශ්චල යන දෙආකාරයේ ම දේපොළ කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව භාර ගැනීම සහ පිළිගැනීම;

(ඉ) ආයතනයේ වාර්ෂික වාර්තාව හා විගණනය කරන ලද ගිණුම් සලකා බැලීම සහ එම වාර්තාව සහ ගිණුම් විශ්වවිද්‍යාලය හා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම;

(ඊ) ආයතනයේ මුදල් ඇස්තමේන්තු පිළියෙල කිරීම හා ඒ ඇස්තමේන්තු විශ්වවිද්‍යාලය හා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම;

(උ) ආයුර්වේද, සිද්ධ සහ යුනානි වෛද්‍ය ක්‍රමවල විශේෂඥ ක්ෂේත්‍ර තුළ පිරිනැමිය යුතු පශ්චාත් උපාධි, පශ්චාත් උපාධි අභිඥන පත්‍ර, පශ්චාත් උපාධි සහතික පත්‍ර හා වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා සහ එවැනි පශ්චාත් උපාධි, පශ්චාත් උපාධි අභිඥන පත්‍ර හා පශ්චාත් උපාධි සහතිකපත්‍ර හා වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා සඳහා සුදුසුකම් ලැබීම පිණිස ශිෂ්‍යයන් අනුගමනය කළ යුතු අධ්‍යයන පාඨමාලා සහ පුහුණු පාඨමාලා ද සමත් විය යුතු විභාග සහ සපුරාලිය යුතු අනෙකුත් කොන්දේසි අදාළ අධ්‍යයන මණ්ඩලය විමසා විශ්වවිද්‍යාලයට නිර්දේශ කිරීම;

(ඌ) අදාළ අධ්‍යයන මණ්ඩලය විමසා අපේක්ෂකයාගේ විශේෂඥතාවය සම්බන්ධයෙන් වූ මණ්ඩලයේ සහතිකය ලබා ගැනීමේ කාර්ය පටිපාටිය පිළිබඳව විශ්වවිද්‍යාලයට නිර්දේශ කිරීම;

(එ) අතුරු ව්‍යවස්ථා හෝ රීති සෑදීමට බලය පැවරී ඇති කවර හෝ කාරණා සඳහා අතුරු ව්‍යවස්ථා හෝ රීති සෑදීම සහ එකී කෙටුම්පත් පැනවීම සඳහා විශ්වවිද්‍යාලයේ සනාතන සභාවට සහ පාලක සභාවට ඉදිරිපත් කිරීම;

එසේ වුවද. අදළ අධ්‍යයන මණ්ඩලයේ වාර්තා සලකා බැලීමෙන් පසුව හැර, අධ්‍යයන පාඨමාලා සහ විභාග සම්බන්ධ අතුරු ව්‍යවස්ථා හෝ රීති සාදනු නොලැබිය යුතු ය.

(ඒ) ආයතනයේ කටයුතු කරගෙන යාම සඳහා අවශ්‍ය ගොඩනැගිලි, පරිශ්‍ර, ලී බඩු, උපකරණ සහ අනෙකුත් ද්‍රව්‍ය සැපයීම;

(ඔ) ආයතනයේ පුහුණුකරුවන් හා පරීක්ෂකවරුන් ලෙස පිළිගැනීමට සුදුසු තැනැත්තන්, අදළ අධ්‍යයන මණ්ඩලය විමසා විශ්වවිද්‍යාලයේ සනාතන සභාවට නිර්දේශ කිරීම;

(ඕ) අදාළ අධ්‍යයන මණ්ඩලයේ වාර්තා සලකා බැලීමෙන් පසුව සහ විශ්වවිද්‍යාලයේ අනුමැතිය ඇතිව, කොමිෂන් සභාවට-

(1) දැනට පවත්නා අධ්‍යයන මණ්ඩල සහ විශේෂඥ මණ්ඩල ප්‍රතිසංවිධානය කිරීම හා නව අධ්‍යයන මණ්ඩල සහ විශේෂඥ මණ්ඩල ස්ථාපිත කිරීම සඳහා යෝජනා ක්‍රම; සහ

(11) අදාළ අධ්‍යයන මණ්ඩලවලට ආයුර්වේද, සිද්ධ සහ යුනානි වෛද්‍ය විද්‍යාවේ විශේෂඥ ක්ෂේත්‍ර පැවරීම; නිර්දේශ කිරීම.

(ක) සුදුසු යැයි සලකනු ලබන ස්ථාවර කමිටු හෝ තත්කාර්ය කමිටු සංඛ්‍යාවක් පත් කිරීම හා ඒවායේ නිර්ණය විෂයයන් නියම කිරීම, ඒ කමිටුවල වාර්තා සලකා බැලීම හා වෙනස් කිරීම් සහිතව හෝ රහිතව ඒ වාර්තා අනුමත කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම;

(ග) විශ්වවිද්‍යාලයේ එකඟත්වය ඇතිව සහ අදාළ අධ්‍යයන මණ්ඩලය විමසා අධ්‍යයන පාඨමාලාවලට ශිෂයන් ඇතුළත් කර ගැනීම සඳහා සපුරාලිය යුතු අවශ්‍යතා නිශ්චය කිරීම;

(ච) ප්‍රයෝජනයට නොයොදවා ඇති යම් ආදායමක් ද ඇතුළුව, ආයතනයට අයත් කවර මුදලක් වුව ද, භාර ආඥාපනතේ 20වන වගන්තියේ විධිවිධාන යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ භාර මුදල් ආයෝජන කිරීම නීත්‍යානුකූල වන්නා වූ යම් සුරැකුම්පතක ආයෝජන කිරීම නැතහොත් කොමිෂන් සභාවේ අනුමැතිය ඇතිව ශ්‍රී ලංකාව තුළ නිශ්චල දේපළ මිළට ගැනීම සඳහා එවැනි මුදලක් ආයෝජනය කිරීම හෝ එවැනි ආයෝජන වෙනස් කිරීම හෝ ඒ මුදල්වලින් වියදම සඳහා වහා අවශ්‍ය නොවන යම් මුදල් ප්‍රමාණයක්, කොමිෂන් සභාව අනුමත කරනු ලබන යම් බැංකුවක ස්ථාවර තැන්පතුවක් ලෙස තැන්පත් කිරීම; සහ

(ඡ) මෙම නියමාවලිය මගින් හෝ වෙනත් යම් උචිත සාධන පත්‍රයක විධිවිධාන සලසා ඇති පරිදි, ආයතනයේ බලතලවල ප්‍රතිඵලයක් වන හෝ ඒ බලතලවලට ආනුෂංගික වන්නා වූ, ආයතනයේ වෙනත් සියලු බලතල ක්‍රියාත්මක කිරීම.

(4) යම් අධ්‍යයන කාරණයක් පිළිබඳ කිසිදු යෝජනා සම්මතයක්, ඒ පිළිබඳව ස්වකීය මතය වාර්තාගත කිරීමට සහ එම මතය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට අධ්‍යයන මණ්ඩලයට ප්‍රථමයෙන් අවස්ථාවක් ලබා දීමෙන් පසුව මිස, මණ්ඩලය විසින් එවැනි යෝජනා සම්මතයක් සම්මත නොකළ යුතු ය.

එසේ වුවද, විශ්වවිද්‍යාලයේ එකඟතාවය ඇතිව මිස එසේ අනුමත කරන යෝජනා සම්මතයක් පරිදි ක්‍රියා නොකළ යුතු ය.

මේ ඡේදයෙහි '' අධ්‍යයන කාරණය'' යන්නෙන්, අදාළ අධ්‍යයන මණ්ඩලයේ පාලනයට හා සාමාන්‍ය විධානයට යටත් කවර හෝ යම් කාරණයක් අදහස් වේ.

12. මණ්ඩලය විසින් පහත සඳහන් එක් එක් වෛද්‍ය ක්‍රමයක් සඳහා අධ්‍යයන මණ්ඩලයක් පිහිටුවිය යුතු අතර, අදාළ අධ්‍යයන මණ්ඩල යටතේ විශේෂඥ මණ්ඩල ස්ථාපිත කළ යුතු ය.

(අ) ආයුර්වේද වෛද්‍ය විද්‍යාව;
(ආ) සිද්ධ වෛද්‍ය විද්‍යාව; සහ
(ඇ) යුනානි වෛද්‍ය විද්‍යාව.

13. (1) ආයුර්වේද වෛද්‍ය විද්‍යා අධ්‍යයන මණ්ඩලය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

(අ) නිල බලයෙන් පත් වන්නා වූ සාමාජිකයකු විය යුතු අධ්‍යක්ෂවරයා;

(ආ) ආයතනයේ අධ්‍යක්ෂවරයා විසින් මුලසුන දරන්නා වූ රැස්වීමේ දී ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයන්, මහාචාර්යවරයන්, සහාය මහාචාර්යවරයන් සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයන් අතරින් තෝරා පත්කර ගන්නා වූ, පනත යටතේ ස්ථාපිත කොළඹ දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ ආයුර්වේද අංශයේ සාමාජිකයන් දෙදෙනෙකු;

(ඇ) ආයතනයේ අධ්‍යක්ෂවරයා විසින් මුලසුන දරන්නා වූ රැස්වීමේ දී ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයන්, මහාචාර්යවරයන්, සහාය මහාචාර්යවරයන් සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයන් අතරින් තෝරා පත්කර ගන්නා වූ, පනත යටතේ හඳුනාගැනෙන ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ සාමාජිකයන් දෙදෙනෙකු;

(ඇ) අදාළ අධ්‍යයන අංශයේ නිර්දේශය පිට පිළිවෙළින් අදාළ ආයතනයේ අධ්‍යක්ෂවරයා විසින් නම් කරන ලද, පනත යටතේ ස්ථාපිත කොළඹ දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ සහ පනත යටතේ හඳුනාගැනෙන ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනයේ,

(i) කාය චිකිත්සා;
(ii) ශල්‍ය ශාලාක්‍ය;
(iii) ප්‍රසූතිතන්ත්‍ර කෞමාරභෘතය;
(iv) දේශීය චිකිත්සා;
(v) ස්වස්ථ වෘත්ත;
(vi) ද්‍රව්‍ය ගුණ විඥාන;
(vii) ශරීර විඥාන;
(viii) මෞලික සිද්ධාන්ත,

යන එක් එක් අධ්‍යයන අංශයකින් ම ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයකු, මහාචාර්යවරයකු, සහාය මහාචාර්යවරයකු හෝ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු බැගින් සහ

(ඉ) ආයුර්වේද කොමසාරිස්වරයා විසින් නම් කරනු ලබන පහත සඳහන් පුහුණු මධ්‍යස්ථානවලින් විශේෂඥ ශ්‍රේණියට අයත් එක් ආයුර්වේද විශේෂඥ ශ්‍රේණියේ වෛද්‍යවරයකු බැගින් -

(i) කොළඹ ආයුර්වේද ශික්ෂණ රෝහල;
(ii) ගම්පහ ආයුර්වේද ශික්ෂණ රෝහල;
(iii) බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනය.

(2) සිද්ධ වෛද්‍ය විද්‍යා අධ්‍යයන මණ්ඩලය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

(අ) නිල බලයෙන් පත් වන්නා වූ සාමාජිකයකු විය යුතු අධ්‍යක්ෂවරයා;

(ආ) අංශ ප්‍රධානියා විසින් මුලසුන දරන්නා වූ රැස්වීමේ දී ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයන්, මහාචාර්යවරයන්, සහාය මහාචාර්යවරයන් හා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයන් අතරින් තෝරා පත්කර ගන්නා වූ පනත යටතේ ස්ථාපිත යාපනය විශ්වවිද්‍යාලයේ සිද්ධ වෛද්‍ය විද්‍යා අංශයේ සාමාජිකයින් දෙදෙනෙකු;

(ඇ) අංශ ප්‍රධානියා විසින් මුලසුන දරන්නා වූ රැස්වීමේ දී ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයන්, මහාචාර්යවරයන්, සහාය මහාචාර්යවරයන් හා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයන් අතරින් තෝරා පත්කර ගන්නා වූ පනත යටතේ ස්ථාපිත නැගෙනහිර විශ්වවිද්‍යාලයේ ත්‍රිකුණාමලය මණ්ඩපයේ සිද්ධ වෛද්‍ය විද්‍යා අංශයේ සාමාජිකයින් දෙදෙනෙකු;

(ඈ) අදාළ අධ්‍යයන අංශයේ නිර්දේශය පිට පිළිවෙළින් අංශ ප්‍රධානියා විසින් නම් කරනු ලබන, පනත යටතේ ස්ථාපිත යාපනය හා ත්‍රිකුණාමලය සිද්ධ වෛද්‍ය විද්‍යා අංශයන් හි,

(i) නොයි නාඩල් චිකිත්සායි ;
(ii) විරණ චිකිත්සායි ;
(iii) කුලන්දයි මරතුවම් මහලිර් මරුතුවම්;
(iv) ගුණපාඩම් ;
(v) මූල තත්තුවම්,

යන එක් එක් අධ්‍යයන අංශයකින් ම ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයකු, මහාචාර්යවරයකු, සහාය මහාචාර්යවරයකු හෝ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු බැගින්; සහ

(ඉ) ආයුර්වේද කොමසාරිස්වරයා විසින් නම් කරනු ලබන පහත සඳහන් පුහුණු මධ්‍යස්ථානවලින් විශේෂඥ ශ්‍රේණියට අයත් එක් සිද්ධ විශේෂඥ ශ්‍රේණියේ වෛද්‍යවරයකු බැගින් -

(i) යාපනයේ කයිතඩි සිද්ධ ශික්ෂණ රෝහල ;
(ii) ත්‍රිකුණාමලයේ සිද්ධ ශික්ෂණ රෝහල ;
(iii) බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනය.

(3) යුනානි වෛද්‍ය විද්‍යා අධ්‍යයන මණ්ඩලය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

(අ) නිල බලයෙන් පත් වන්නා වූ සාමාජිකයකු විය යුතු අධ්‍යක්ෂවරයා;

(ආ) ආයතනයේ අධ්‍යක්ෂවරයා විසින් මුලසුන දරන්නා වූ රැස්වීමේ දී ජෞෂ්ඨ මහාචාර්යවරයන්, මහාචාර්යවරයන්, සහාය මහාචාර්යවරයන් හා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයන් අතරින් තෝරා පත්කර ගන්නා වූ පනත යටතේ ස්ථාපිත කොළඹ දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ යුනානි අංශයෙන් සාමාජිකයින් දෙදෙනෙකු;

(ඇ) අදළ අධ්‍යයන අංශයේ නිර්දේශය පිට පිළිවෙළින් ආයතනයේ අධ්‍යක්ෂවරයා විසින් නම් කරනු ලබන, පනත යටතේ ස්ථාපිත කොළඹ දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ,

- (i) මෝලිජාත්;
- (ii) ඉල්මුල් ජරාහත්;
- (iii) අම්රාස්-ඊ-නිස්වාන් වො කබලාත් වො-අට්ෆාල්;
- (iv) දේශීය ඉලාජ්;
- (v) තහෆුසි වො සමාජි තිබ්;
- (vi) ඉල්මුල් අද්වියා;
- (vii) කුල්ලියාත්,

යන එක් එක් අධ්‍යයන අංශයකින් ම ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයකු, මහාචාර්යවරයකු, සහාය මහාචාර්යවරයකු හෝ ජ්‍යෙෂ්ඨ කථාකාචාර්යවරයකු බැගින් ; සහ

(ඈ) ආයුර්වේද කොමසාරිස්වරයා විසින් නම් කරනු ලබන පහත සඳහන් පුහුණු මධ්‍යස්ථානවලින් විශේෂඥ ශ්‍රේණියට අයත් එක් යුනානි විශේෂඥ ශ්‍රේණියේ වෛද්‍යවරයෙකු බැගින් -

- (i) කොළඹ ආයුර්වේද ශික්ෂණ රෝහල
- (ii) බණ්ඩාරණායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනය.

(4) අධ්‍යයන මණ්ඩලයට සාමාජිකයන් පත් කිරීම -

(අ) අදළ අධ්‍යක්ෂවරු. උපාධි ආයතන හෝ අංශවල ප්‍රධානීන් විසින් පුහුණුකරුවකු වීම සඳහා වූ අවශ්‍යතා සපුරන්නා වූ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් විමසා අධ්‍යයන මණ්ඩලයක ශාස්ත්‍රීය අධ්‍යයන අංශ නාමිකයන් තෝරා පත්කර ගත යුතු අතර, එකී නාමිකයන් ආයතනයේ අධ්‍යක්ෂවරයා වෙත යොමු කළ යුතු ය.

(ආ) රෝහල් අධ්‍යක්ෂකවරයා හෝ මධ්‍යස්ථානයේ ප්‍රධානියා විසින් මුලසුන දරන්නා වූ රැස්වීමකදී පුහුණුකරුවකු වීම සඳහා වූ අවශ්‍යතා සපුරන්නා වූ විශේෂඥ ශ්‍රේණියේ වෛද්‍යවරුන් අතරින් දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ පුහුණු මධ්‍යස්ථානයෙන් නාමිකයින් තෝරා ගත යුතු ය. ආයුර්වේද කොමසාරිස්වරයා විසින් එකී නාමිකයන් ආයතනයේ අධ්‍යක්ෂවරයා වෙත යොමු කළ යුතු ය.

(5) යම් අධ්‍යයන මණ්ඩලයක් විසින් කළමණාකාර මණ්ඩලයේ එකඟත්වය ඇතිව, නිශ්චිතව දක්වා ඇති කාර්යයක් සඳහා වසරක කාල සීමාවක් දක්වා උපරිම වශයෙන් තිදෙනෙකු අතිරේකව යොදවා ගත හැකි ය. එසේ අතිරේකව යොදවා ගත් කිසිදු තැනැත්තෙකුට එකී අධ්‍යයන මණ්ඩලයේ යම් ඡන්ද විමසීමකදී ඉදිරිපත් වීමට හෝ යම් රැස්වීමක දී ඡන්දය ප්‍රකාශ කිරීමට අයිතියක් නොමැත්තේ ය.

(6) (අ) අධ්‍යයන මණ්ඩලයේ යම් සාමාජිකයකු, නියමිත කාලයට පෙර ධූරයෙන් ඉවත් වන්නේ නම් මිස. ඔහු තෝරා පත් කරනු ලැබුවේ හෝ පත් කරනු ලැබුවේ යම් දිනක සිට ද, එදින සිට ගණන් ගැනෙන අවුරුදු තුනක කාලයක් සඳහා ධූරය දැරිය යුතු අතර, නැවත තෝරාපත් කරනු ලැබීමට හෝ නැවත පත් කරනු ලැබීමට ඔහු සුදුස්සෙක් වන්නේ ය.

එසේ වුවද, තෝරා පත් කරනු ලැබූ හෝ පත් කරනු ලැබූ යම් සාමාජිකයකු, ස්වකීය ධූර කාලයට පෙර තමාගේ ධූරය අත්හරිනු ලබන අවස්ථාවක දී ඔහුගේ අනුප්‍රාප්තිකයා විසින් සිය ධූරය කලින් අත් හරින්නේ නම් මිස, පූර්වගාමියාගේ කාලයෙන් නොගෙවී ඉතිරි ව තිබූ ධූර කාලය සඳහා ධූර දරන්නේ ය.

එසේම තවදුරටත්, යම් තෝරා පත් කරනු ලැබූ හෝ පත් කරනු ලැබූ එක් එක් සාමාජිකයෙක්ම, තමා අධ්‍යයන මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් තෝරා පත් කරනු ලැබීම සඳහා හෝ පත් කිරීම සඳහා සුදුස්සකු වූයේ යම් තත්ත්වයක් හෝ සාමාජිකත්වයක් අනුව ද, ඒ තත්ත්වය හෝ සාමාජිකත්වය දරනතාක් පමණක් ඔහු තම ධූරය දැරිය යුතු අතර, රෝහලෙන්. ආයතනයෙන්, විශ්වවිද්‍යාලයෙන් හෝ අධ්‍යයන අංශයෙන් ඉල්ලා අස්වීමේ දී, විශ්‍රාම යාමේ දී හෝ මාරු වීමේ දී සාමාජිකයකු වීම අවසන් වන්නේ ය.

(ආ) අධ්‍යක්ෂවරයා වෙත යවනු ලබන තම අත්සන යටතේ වූ ලිපියක් මගින් අධ්‍යයන මණ්ඩලයේ යම් සාමාජිකයකු විසින් ස්වකීය ධූරයෙන් ඉල්ලා අස් විය හැකි ය.

(ඇ) නොපැමිණීමේ අවසරය නොමැතිව අධ්‍යයන මණ්ඩලයේ අඛණ්ඩව රැස්වීම් තුනකට සහභාගි වීමට අපොහොසත්වන අධ්‍යයන මණ්ඩලයේ යම් තෝරා පත් කරනු ලැබූ හෝ පත් කරනු ලැබූ යම් සාමාජිකයකු, අධ්‍යයන මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් වූ තම ධූරය අත්හරිනු ලැබුවා සේ සලකනු ලැබිය යුතු අතර, එසේ ඇතිවන පුරප්පාඩුව පිරවීම සඳහා අධ්‍යක්ෂවරයා විසින් සුදුසු තැනැත්තෙකු පත් කිරීමට පියවර ගනු ලැබිය යුතු ය.

(ඈ) යම් වලංගු හේතුවක් නිසාවෙන් තනතුරට නියම කරන ලද සාමාජිකයන් යම් සංඛ්‍යාවක්, අධ්‍යයන මණ්ඩලයට හෝ විශේෂඥ මණ්ඩලයට පත්කර ගත නොහැකි අවස්ථාවල දී, අදළ අධ්‍යයන මණ්ඩලය හෝ විශේෂඥ මණ්ඩලය විමසීමෙන් පසුව. එකී පුරප්පාඩුව පිරවීම සඳහා සුදුසුකම්ලත් තැනැත්තන් පත් කරනු ලැබීමට මණ්ඩලයට බලය තිබිය යුතු ය.

(ඉ) මණ්ඩලයේ මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට නොඅඩු ඡන්ද සංඛ්‍යාවකින් සම්මත කර ගනු ලැබූ විශ්වාසභංග යෝජනාවක් මගින් අධ්‍යයන මණ්ඩලයක් විසුරුවා හැරීමට හෝ අධ්‍යයන මණ්ඩලයක සාමාජිකයකු ඉවත් කිරීමට මණ්ඩලයට බලය තිබිය යුතු ය.

(7) (අ) එක් එක් අධ්‍යයන මණ්ඩලයක් සඳහා එකී අධ්‍යයන මණ්ඩලය විසින් ස්වකීය සාමාජිකයන් අතරින් තෝරා පත් කරගනු ලබන සභාපතිවරයකු සිටිය යුතු ය.

(ආ) සභාපතිවරයාගේ ධූර කාලය අධ්‍යයන මණ්ඩලයේ ධූර කාලය විය යුතු ය.

(8) (අ) සෑම අධ්‍යයන මණ්ඩලයකටම අදළ අධ්‍යයන මණ්ඩලයේ නිර්දේශය පිට මණ්ඩලය විසින් පත් කරනු ලැබූ, අධ්‍යයන මණ්ඩලයේ සාමාජිකයකු වන ලේකම්වරයකු සිටිය යුතු ය.

(ආ) ලේකම්වරයාගේ ධූර කාලය අධ්‍යයන මණ්ඩලයේ ධූර කාලය විය යුතු ය.

(9) (1) වන, (2) වන හා (3) වන අනුඡේදය යටතේ පත් කළ යම් අධ්‍යයන මණ්ඩලයක රැස්වීමක් සඳහා අවශ්‍ය සණ පූර්ණය අතිරේකව යොදවා ගනු ලැබූ සාමාජිකයන් සිටී නම්, ඔවුන් හැර මුළු සාමාජිකත්වයෙන් තුනෙන් එකක් විය යුතු ය.

(10) එක් එක් අධ්‍යයන මණ්ඩලයක්ම එක් වසරක් සඳහා අවම වශයෙන් රැස්වීම් දහයකට නොඅඩු සංඛ්‍යාවක් පැවැත්වෙන පරිදි අවශ්‍ය කවර අවස්ථාවක වුවද, රැස්විය යුතු ය.

14. (1) පනතේ විධිවිධානවලට හා යම් උචිත සාධන පත්‍රයකට යටත්ව ආයුර්වේද, සිද්ධ සහ යුනානි වෛද්‍ය විද්‍යාව හා සම්බන්ධිත විශේෂඥ ක්ෂේත්‍රයන්හි ඉගැන්වීම, අධ්‍යාපනය, පර්යේෂණ හා විභාග පිළිබඳ පාලනය හා මෙහෙයවීම සෑම අධ්‍යයන මණ්ඩලයක්ම සතු විය යුතු ය.

(2) (1) වන අනුඡේදයෙන් සෑම අධ්‍යයන මණ්ඩලයකටම පවරනු ලැබූ බලතලවල ව්‍යාප්තියට අගතියක් නොමැතිව, ආයුර්වේද, සිද්ධ සහ යුනානි වෛද්‍ය විද්‍යාව හා සම්බන්ධිත විශේෂඥ ක්ෂේත්‍ර සම්බන්ධ පහත සඳහන් බලතල, කාර්යය හා කර්තව්‍ය සෑම අධ්‍යයන මණ්ඩලයක් විසින්ම භාවිත කිරීම, ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කළ යුතු ය.

(අ) මණ්ඩලය විසින් එයට යොමු කරන්නා වූ යම් කරුණක් පිළිබඳව සලකා බැලීම සහ වාර්තා කිරීම;

(ආ) අදළ විශේෂඥ ක්ෂේත්‍රයට අදළ අධ්‍යයන පාඨමාලා, පුහුණු වැඩසටහන් හෝ වැඩසටහන් සහ විභාග හා සම්බන්ධිත සියලු කාරණා පිළිබඳව නිර්දේශ හා වාර්තාවක් මණ්ඩලයට ඉදිරිපත් කිරීම;

(ඇ) අදළ විශේෂඥ ක්ෂේත්‍රය හා සම්බන්ධිත යම් විශේෂ විෂයයක් හෝ විෂයයන් පිළිබඳව සලකා බැලීමේ හා වාර්තා කිරීමේ කාර්යය සඳහා අධ්‍යයන මණ්ඩලයේ සාමාජිකයින්ට අමතරව, වෙනත් තැනැත්තන් ඇතුළත් විය හැකි කමිටු පත් කිරීමට නිර්දේශ කිරීම;

(ඈ) අධ්‍යයන පාඨමාලා හා විභාගවලට ශිෂ්‍යයන් ඇතුළත් කර ගැනීම සඳහා වන නියම කිරීම් මණ්ඩලයට නිර්දේශ කිරීම;

(ඉ) අදළ විශේෂඥ ක්ෂේත්‍රයේ අධ්‍යයන පාඨමාලා හා විභාගවලට අදළව නියෝග සෑදීම සහ එකී කෙටුම්පත් මණ්ඩලයට ඉදිරිපත් කිරීම;

(ඊ) පුහුණුකරුවන් හා පරීක්ෂකවරුන් වශයෙන් පිළිගැනීමට සුදුසු තැනැත්තන් මණ්ඩලයට නිර්දේශ කිරීම;

(උ) අදළ විශේෂඥ ක්ෂේත්‍රයේ නියමිත විභාග සමත් හා නියමිත වෙනත් කොන්දේසි සපුරා ඇති, පශ්චාත් උපාධි, පශ්චාත් අභිඥාන පත්‍ර. පශ්චාත් උපාධි සහතිකපත්‍ර හා එකී විශේෂඥ ක්ෂේත්‍රයේ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා පිරිනැමීමට සුදුසු තැනැත්තන් මණ්ඩලයට නිර්දේශ කිරීම;

(ඌ) අධිශිෂ්‍යත්ව. ශිෂ්‍යත්ව, ඡාත්‍ර දක්ෂිණා, ශිෂ්‍යාධාර, පදක්කම් හා වෙනත් ත්‍යාග සඳහා ඇති තරග කිරීමේ ක්‍රමය සහ කොන්දේසි මණ්ඩලයට නිර්දේශ කිරීම;

(එ) අධිශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, ඡාත්‍ර දක්ෂිණා, ශිෂ්‍යාධාර, පදක්කම් හා වෙනත් ත්‍යාග පිරිනැමීම සඳහා සුදුසු තැනැත්තන්ගේ නාමයන් මණ්ඩලයට නිර්දේශ කිරීම;

(ඒ) (i) පවත්නා අධ්‍යයන මණ්ඩල ප්‍රතිසංවිධානය කිරීම සඳහා සැලසුම් සහ නව අධ්‍යයන මණ්ඩල සංවිධානය කිරීම; සහ

(ii) අදළ අධ්‍යයන මණ්ඩලයට ආයුර්වේද, සිද්ධ සහ යුනානි වෛද්‍ය විද්‍යා විශේෂඥ ක්ෂේත්‍ර පැවරීම.

පිළිබඳව මණ්ඩලයට නිර්දේශ කිරීම.

(3) අදළ අධ්‍යයන මණ්ඩලයේ අනුමැතිය ඇතිව, මණ්ඩලය විසින් විශේෂඥ ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂඥ මණ්ඩල ස්ථාපිත කළ යුතු අතර,

(අ) ආයුර්වේද, සිද්ධ සහ යුනානි විශේෂඥ ක්ෂේත්‍රවලට අදළව මණ්ඩලය විසින් ස්ථාපිත එක් එක් විශේෂඥ මණ්ඩලයක්ම අදළ අධ්‍යයන මණ්ඩලයේ සාමාන්‍ය විධාන යටතේ ක්‍රියාත්මක විය යුතු ය.

(ආ) අදළ අධ්‍යයන මණ්ඩලයේ සාමාන්‍ය විධානය යටතේ ඉගැන්වීම, අධ්‍යාපනය, පුහුණුව හා ඇගැයීම ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂඥ ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂඥ මණ්ඩලයක් ස්ථාපිත කර ඇති අවස්ථාවකදී, එම විශේෂඥ මණ්ඩලය පහත සඳහන් සාමාජිකයන් දස දෙනෙකුගෙන් සමන්විත විය යුතු ය.

(i) අධ්‍යක්ෂවරයා;

(ii) අවම වශයෙන් සාමාජිකයන් තිදෙනෙකු අදළ විශේෂඥ ක්ෂේත්‍රයේ විශේෂඥ ශ්‍රේණියේ වෛද්‍යවරයන් වන සහ පනත යටතේ ස්ථාපිත, යම් උපාධි ආයතනයක, ආයුර්වේද, සිද්ධ හෝ යුනානි වෛද්‍ය විද්‍යා අංශ හෝ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ පුහුණු මධ්‍යස්ථානවල රැකියාවෙහි නියුක්ත හෝ රැකියාවෙහි නියුක්තව සිටි තැනැත්තන් අතරින් අදළ අධ්‍යයන මණ්ඩලය විසින් නම් කරන ලද සහ මණ්ඩලය විසින් අනුමත කළ සාමාජිකයින් හය දෙනෙකු;

(iii) අදළ විශේෂඥ ක්ෂේත්‍රයන්ගේ විශේෂඥ ශ්‍රේණියේ වෛද්‍යවරයන් අතරින් මණ්ඩලය විසින් නම් කරන ලද සාමාජිකයන් තිදෙනෙකු;

(ඇ) සෑම විශේෂඥ මණ්ඩලයකට ම එහි සාමාජිකයන් අතරින් විශේෂඥ මණ්ඩලයේ සාමාජිකයන් විසින් තෝරා පත්කර ගනු ලබන සභාපතිවරයකු හා ලේකම්වරයකු සිටිය යුතු අතර, ධූරයේ සේවා කාලය විශේෂඥ මණ්ඩලයේ සේවා කාලය විය යුතු ය;

(ඈ) විශේෂඥ මණ්ඩල යම් රැස්වීමක් සඳහා අවශ්‍ය සණපූරණය අතිරේකව යොදවා ගනු ලැබූ සාමාජිකයන් සිටී නම් ඔවුන් හැරුණු කොට, මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකක් විය යුතු ය;

(ඉ) විශේෂඥ මණ්ඩලයක ධූර කාලය, අධ්‍යයන මණ්ඩලයක ධූර කාලය අවසන් වන දිනය විය යුතු ය;

(ඊ) එක් එක් වර්ෂයක දී සෑම විශේෂඥ මණ්ඩලයක් විසින්ම අවම වශයෙන් රැස්වීම් හයක් පැවැත්විය යුතු ය;

(උ) එක් එක් විශේෂඥ මණ්ඩලයක් විසින් යම් නිශ්චිත කාර්යයක් හා යම් නිශ්චිත කාල සීමාවක් සඳහා අතිරේක විශේෂඥ ශ්‍රේණියේ වෛද්‍යවරයන් නිර්දේශ කළ හැකි අතර, එසේ නිර්දේශය ලත් කිසිදු තැනැත්තෙකුට විශේෂඥ මණ්ඩලයේ යම් රැස්වීමකදී ඡන්ද විමසීමකට ඉදිරිපත් වීම හෝ ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය නොතිබිය යුතු ය;

(ඌ) සලකා බලනු ලබන අධ්‍යයන මණ්ඩලයේ සාමාජිකයකු නොවන්නා වූ විශේෂඥ මණ්ඩලයේ සාමාජිකයකුට අදළ අධ්‍යයන මණ්ඩල රැස්වීමක දී එම විශේෂඥ මණ්ඩලයට අදළ කරුණු ඉදිරිපත් කිරීමට පැවරී ඇති අවස්ථාවකදී, එකී නාමිකයා එම විශේෂිත ඉදිරිපත් කිරීම සඳහා නිසි පරිදි අතිරේකව යොදවා ගන්නා ලද බවට සලකනු ලැබිය යුතු අතර, එකී ඉදිරිපත් කිරීම සම්පූර්ණ කිරීම මත අතිරේකව තේරී පත් වූ සාමාජිකත්වය අහෝසි වන්නේ ය;

(එ) මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට නොඅඩු සංඛ්‍යාවකින් සම්මත කරගනු ලැබූ විශ්වාසභංග යෝජනාවක් මගින් විශේෂඥ මණ්ඩලයක් විසුරුවා හැරීමට හෝ සාමාජිකයකු ඉවත් කිරීමට මණ්ඩලයට බලය තිබිය යුතු ය.

(4) පනතේ විධිවිධානවලට, නියමාවලියට හෝ යම් උචිත සාධන පත්‍රයකට සහ අධ්‍යයන මණ්ඩලයේ සාමාන්‍ය විධානය හා පාලනයට යටත්ව සෑම විශේෂඥ මණ්ඩලයක් ම පහත සඳහන් කර්තව්‍ය සිදු කිරීම හා ඉටු කිරීම කළ යුතු ය-

(අ) විශේෂඥ ක්ෂේත්‍රයට අදළ අධ්‍යයන පාඨමාලා, පුහුණු වැඩසටහන්, විෂය මාලා හා විභාග හා සම්බන්ධිත සියලු කාරණා පිළිබඳව නිර්දේශ හා වාර්තාවක් අදළ අධ්‍යයන මණ්ඩලයට ඉදිරිපත් කිරීම;

(ආ) විශේෂඥ ක්ෂේත්‍රය හා සම්බන්ධිත යම් විශේෂ විෂයයක් පිළිබඳව සලකා බැලීමේ හා වාර්තා කිරීමේ කාර්යය සඳහා විශේෂඥ මණ්ඩලයේ සාමාජිකයින්ට අමතරව වෙනත් තැනැත්තන් ඇතුළත් විය හැකි උප කමිටු අදළ පරිදි පත් කිරීමට නිර්දේශ කිරීම;

(ඇ) අධ්‍යයන පාඨමාලා, පුහුණු වැඩසටහන්, හා විභාගවලට පුහුණුවන්නන් ඇතුළත් කර ගැනීම සඳහා වන නියම කිරීම් අධ්‍යයන මණ්ඩලයට නිර්දේශ කිරීම;

(ඈ) අධ්‍යයන පාඨමාලා හා විභාගවලට අදළ කෙටුම්පත් කරන ලද නියෝග අධ්‍යයනය මණ්ඩලයට ඉදිරිපත් කිරීම;

(ඉ) අදළ කර්තව්‍යයන් නියම කරන්නා වූ පොදු රීති හා නියෝග සමඟ අනුකූල වන්නා වූ පරිදි පුහුණුකරුවන් හා පරීක්ෂකවරුන් වශයෙන් පිළිගැනීමට සුදුසු තැනැත්තන් අධ්‍යයන මණ්ඩලයට නිර්දේශ කිරීම; සහ

(ඊ) මණ්ඩලය හෝ සලකනු ලබන්නා වූ අධ්‍යයන මණ්ඩලය විසින් විශේෂඥ මණ්ඩලයට යොමු කරන්නා වූ කරුණු පිළිබඳව වාර්තා කිරීම.

15. ආයතනයේ මුදල් වර්ෂය, ආණ්ඩුවේ මුදල් වර්ෂයම වන්නේ ය.

16. (1) ආයතනයට (මෙහි මින්මතු ''අරමුදල්'' යනුවෙන් සඳහන් කරනු ලබන) දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අරමුදල යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් තිබිය යුතු අතර, පහත සඳහන් මුදල් එයට ගෙවිය යුතු ය-

(අ) යම් උචිත සාධන පත්‍රයක විධිවිධාන අනුව ආයතනයට ගෙවිය යුතු ගාස්තු;

(ආ) පරිත්‍යාගවලින් ලැබෙන ආදයම;

(ඇ) පාර්ලිමේන්තුව විසින් ප්‍රතිපාදනය කරනු ලදුව, කොමිෂන් සභාව විසින් ආයතනයට ආධාර වශයෙන් වෙන් කරනු ලබන්නා වූ මුදල්;

(ඈ) ආයතනයට අයිති වූද කවර ප්‍රභවයකින් හෝ අත් කර ගනු ලැබුවාවූද වෙනත් සියලු මුදල්.

(2) යම්කිසි මාසයක් තුළ දී අරමුදලට ගෙවනු ලබන සියලු මුදල් ප්‍රමාණයන් පිළිබඳ සාරාංශයක්, උචිත වූ ආදයම් ශීර්ෂ යටතේ වර්ග කර, ඊලඟ ඉදිරි මාසය අවසාන වීමට පෙර අධ්‍යක්ෂවරයා විසින් කොමිෂන් සභාවට දැනගැනීම පිණිස ඉදිරිපත් කළ යුතු ය.

17 (අ) නියමාවලිය මගින් කලින් කළ නියම කරනු ලබන පිළිවෙළට හා ආකාරයට ආයතනයේ ගණන් තැබීම;

(ආ) අරමුදලට ගෙවනු ලබන සියලු මුදල් භාර ගැනීම සහ ඒ මුදල් නිසි ගණන් ශීර්ෂයන්ට බැර කිරීම;

(ඇ) බලය දෙනු ලැබූ සියලු ගෙවීම් කිරීම;

(ඈ) මණ්ඩලය සඳහා කොමිෂන් සභාව විසින් නියම කරන ලද අවශ්‍ය ත්‍රෛවාර්ෂික ඇස්තමේන්තු හා ඉදිරි වර්ෂය සඳහා වාර්ෂික මුදල් විසර්ජන පිළියෙල කිරීම.

අධ්‍යක්ෂවරයාගේ කාර්යය වන්නේ ය.

එසේ වුවද, ආයතනයේ ගිණුම්වල, නිශ්චිත කාර්යය සඳහා කරනු ලබන ප්‍රතිපාදනවලින් හෝ නිශ්චිත අරමුණු සඳහා ලබන පරිත්‍යාගවලින් ලැබෙන ආදයම් සම්බන්ධයෙන් වෙනම ගිණුම් පෙන්නුම් කළ යුතු අතර, ආයතනයේ සාමාන්‍ය කාර්යය සඳහා හෝ ඒ ප්‍රතිපාදන හෝ ඒ පරිත්‍යාග කරනු ලැබුවේ පිළිවෙළින් යම් කාර්යය හෝ අරමුණ සඳහා ද, ඒ කාර්යය හෝ අරමුණ නොවන කරුණු සඳහා ඒ ආදයමෙන් කිසිදු ගෙවීමක් නොකළ යුතු ය.

18. (1) කොමිෂන් සභාව විසින් කලින් කළ නියම කරනු ලබන පිළිවෙළට හා ආකාරයට සහ එසේ නියම කරනු ලබන විස්තර ඇතුළත් කොට සිය ආයතනයේ කටයුතුවලට අදළ වාර්ෂික ගිණුම් ප්‍රකාශනයක් හා සංඛ්‍යා ලේඛන පිළිබඳ ප්‍රකාශයන් ආයතනය විසින් පිළියෙළ කළ යුතු ය.

(2) ආයතනයේ ගණන් පොත් ආයතනයේ කාර්යාලයෙහි තැබිය යුතු ය.

19. උසස් අධ්‍යාපන ආයතනවල ගිණුම් විගණනය හා සම්බන්ධයෙන් පනතේ XIII වන කොටසේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ආයතනයේ ගිණුම් විගණනය සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

20. (1) විශ්වවිද්‍යාලයේ එකඟත්වය හා කොමිෂන් සභාවේ අනුමැතිය ඇතිව ආයතනයේ බලතල, කාර්යය හා කර්තව්‍ය කාර්යක්ෂමව කිරීම, ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා අවශ්‍ය යැයි සලකනු ලබන නිලධරයන්ගෙන් හා වෙනත් සේවකයන්ගෙන් ආයතනයේ කාර්ය මණ්ඩලය සමන්විත විය යුතු ය.

(2) ආයතනයේ කාර්ය මණ්ඩලය අවස්ථාවෝචිත පරිදි, විශ්වවිද්‍යාලය විසින් ස්වකීය කාර්ය මණ්ඩලයෙන් මුදා හැරීමෙන් ලබාදීම හෝ කොමිෂන් සභාව හෝ විශ්වවිද්‍යාලය විසින් පත් කිරීමෙන් හෝ කළ යුතු ය. පනතේ X වන කොටසේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ආයතනයේ කාර්ය මණ්ඩලයට පත් කිරීම කෙරෙහි හා පත් කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) පූර්ණ කාල පදනම මත විශ්වවිද්‍යාලයේ යම් නිලධරයකු හෝ වෙනත් සේවකයකු ආයතනයේ සේවය සඳහා පූර්ණ කාල පදනමක් මත මුදා හැර ඇති අවස්ථාවක, විශ්වවිද්‍යාලයේ ඔහුගේ නිත්‍ය තනතුරේ හිමි වේතනය හා දීමනා ආයතනය විසින් ගෙවිය යුතු ය. වෙනත් ඕනෑම අවස්ථාවක දී, විශ්වවිද්‍යාලය විමසා හා කොමිෂන් සභාවේ අනුමැතිය ඇතිව ආයතනය විසින් නිශ්චය කරනු ලබන දීමනාවක් අදාළ නිලධරයාට හෝ වෙනත් සේවකයාට ගෙවිය හැකි ය.

(4) ආයතනයේ කාර්ය මණ්ඩලය, අධ්‍යක්ෂවරයාගේ විධානයට හා විනය පාලනයට යටත් විය යුතු ය.

21. ආයතනයේ යම් බල මණ්ඩලයකට හෝ වෙනත් මණ්ඩලයකට යම් තැනැත්තකු යථා පරිදි තෝරා පත් කරනු ලැබී ද. පත් කරගනු ලැබී ද, අතිරේකව යොදවා ගනු ලැබී ද, නැතහොත් ඔහු ඒ බලමණ්ඩලයේ හෝ වෙනත් මණ්ඩලයේ සාමාජිකයකුව සිටීමට හිමිකම් ලබා තිබේ ද යන්න ගැන යම් ප්‍රශ්නයක් පැන නැගුණු අවස්ථාවක දී, මණ්ඩලයට එසේ පැන නැගුණු ප්‍රශ්නය විසඳා ගැනීමට නොහැකි වුවහොත් එම ප්‍රශ්නය කොමිෂන් සභාව වෙත යොමු කළ යුතු අතර, ඒ පිළිබඳව කොමිෂන් සභාවේ තීරණය අවසානාත්මක වන්නේ ය.

22. ආයතනයේ යම් බල මණ්ඩලයක හෝ වෙනත් මණ්ඩලයක කිසිම ක්‍රියාවක්, යෝජනා සම්මතයක් හෝ ක්‍රියා මාර්ගයක්, එහි සාමාජිකයන් අතර පුරප්පාඩුවක් හෝ පුරප්පාඩු තිබීමේ හෝ එහි සාමාජිකයන් පත් කිරීම් යම් දෝෂයක් හෝ දෝෂ ඇතිවීමේ හේතුවෙන් මත පමණක් අවලංගු නොවන්නේ ය.

23. මෙම නියමාවලිය ක්‍රියාත්මකභාවයට එළඹීම මත, පශ්චාත් උපාධි, පශ්චාත් උපාධි අභිඥාන පත්‍ර, පශ්චාත් උපාධි සහතික පත්‍ර සහ ආයුර්වේද, සිද්ධ සහ යුනානි වෛද්‍ය විද්‍යා විශේෂඥ ක්ෂේත්‍රවල වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා ප්‍රදානය කිරීමේ හා පිරිනැමීමේ බලතල, ශ්‍රී ලංකාවේ කොළඹ විශ්වවිද්‍යාලයට පමණක් පැවරිය යුතු ය.

එසේ වුව ද,

(1) ශ්‍රී ලංකාවේ කොළඹ විශ්වවිද්‍යාලය විසින් ආයතනයේ නිර්දේශය පිට පමණක් එකී පශ්චාත් උපාධි, පශ්චාත් උපාධි අභිඥාන පත්‍ර, පශ්චාත් උපාධි සහතික පත්‍ර සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා ප්‍රදානය සහ පිරිනැමීම සිදු කළ යුතු ය;

(2) පනත යටතේ ස්ථාපිත හෝ ස්ථාපිත කර ඇති බවට සලකනු ලබන්නාවූ යම් විශ්වවිද්‍යාලයක් විසින්, 13 වන ඡේදයේ විධිවිධාන යටතේ ආයතනය විසින් අධ්‍යයන මණ්ඩලයක් ස්ථාපිත කර නොමැති අවස්ථාවකදී, එකී පශ්චාත් උපාධි, පශ්චාත් උපාධි අභිඥාන පත්‍ර, පශ්චාත් උපාධි සහතික පත්‍ර හා ආයුර්වේද, සිද්ධ සහ යුනානි වෛද්‍ය විද්‍යා විශේෂඥ ක්ෂේත්‍රවල වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා ප්‍රදානය කිරීම හෝ පිරිනැමීම කළ හැකි ය;

(3) 13 වන ඡේදයේ විධිවිධාන යටතේ ආයතනය විසින් යම් විශේෂඥ ක්ෂේත්‍ර සම්බන්ධව අධ්‍යයන මණ්ඩලයක් ස්ථාපිතව තිබුණ ද, එසේ නොතිබුණ ද, මේ පනත යටතේ ස්ථාපිත හෝ ස්ථාපනය කර ඇති බවට සලකනු ලබන යම් විශ්වවිද්‍යාලයක් විසින් ආයුර්වේද, සිද්ධ සහ යුනානි වෛද්‍ය විද්‍යාවේ යම් විශේෂඥ ක්ෂේත්‍රයක් මත පූර්ණ හෝ අර්ධ වශයෙන් පදනම් වූ පර්යේෂණයක පශ්චාත් උපාධි ප්‍රදානය කිරීම හෝ පිරිනැමීම කළ හැකි ය ; සහ

(4) කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව සහ ශ්‍රී ලංකාවේ කොළඹ විශ්වවිද්‍යාලයේ සහ ආයතනයේ විධිවිධාන මත වෘත්තීය මණ්ඩල විසින් ආයුර්වේද, සිද්ධ සහ යුනානි වෛද්‍ය විද්‍යාවේ විශේෂඥ ක්ෂේත්‍ර තුළ ශාස්ත්‍රීය විශිෂ්ඨතා පිරිනැමිය හැකි ය.

24. මෙම නියමාවලියේ -

'' පනත'' යන්නෙන්, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත අදහස් වේ;

''උචිත සාධන පත්‍රය'' යන්නෙන්, මේ පනතේ විධිවිධාන යටතේ සාදනු ලැබූ යම් නියමයක්, නියමාවලියක්, ලිඛිත ව්‍යවස්ථාවක්, අතුරු ව්‍යවස්ථාවක්, නියෝගයක් හෝ රීතියක් අදහස් වේ;

''කොමිෂන් සභාව'' යන්නෙන්, විශ්වවිද්‍යාල පනත යටතේ ස්ථාපිත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අදහස් වේ;

''පරීක්ෂකවරයා'' යන්නෙන්, මණ්ඩල සහතිකය ලැබීමෙන් පසු වසර 5 ක පළපුරුද්ද ඇති හෝ ඒ හා සමාන සුදුසුකම් ඇති හෝ මණ්ඩල සහතික වරප්‍රසාද සඳහා සුදුසුකම් ඇති හා යම් විශ්වවිද්‍යාලයක හෝ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ක්‍රියාකාරී සේවයේ යෙදී සිටින තැනැත්තකු අදහස් වේ;

''වෘත්තීය මණ්ඩලය'' යන්නෙන්, යම් සමාගමක්, විද්‍යායතනයක් හෝ පාර්ලිමේන්තුවේ පනතක් මගින් සංස්ථාපනය කළ ආයුර්වේද, සිද්ධ සහ යුනානි වෛද්‍ය විද්‍යාවේ යම් විශේෂඥ ක්ෂේත්‍රයක තැනැත්තන්ගේ වෙනත් මණ්ඩලයක් හෝ මණ්ඩලය විසින් පිළිගැනීමට ලක්වූවක් අදහස් වේ;

''පුහුණුකරුවා'' යන්නෙන්, මණ්ඩල සහතිකය ලැබීමෙන් පසු වසර 3 ක පළපුරුද්ද ඇති හෝ ඒ හා සමාන සුදුසුකම් හෝ මණ්ඩල සහතික වරප්‍රසාද සඳහා සුදුසුකම් ඇති හා යම් විශ්වවිද්‍යාලයක හෝ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ක්‍රියාකාරී සේවයේ යෙදී සිටින තැනැත්තකු අදහස් වේ;

''පුහුණු මධ්‍යස්ථානය'' යන්නෙන්, අධ්‍යයන මණ්ඩලයේ දැනට පවතින යම් සාමාජිකත්වයකට අගතියක් නොවන පරිදි, සාධාරණ දැනුම් දීමක් සමඟ අදාළ අධ්‍යයන මණ්ඩලයේ නිර්දේශය පිට මණ්ඩලය හා සනාතන සභාව විසින් අනුමත කළ විශේෂඥ ක්ෂේත්‍රවල උපදේශනය හා පුහුණුව සපයන්නා වූ හෝ උපදේශනය හෝ පුහුණුව සපයන්නා වූ රෝහලක්, වාට්ටුවක් හෝ අංශයක් අදහස් වේ;

''ආයුර්වේද වෛද්‍ය විද්‍යාවේ විශේෂඥ ක්ෂේත්‍රය'' යන්නෙන්, කාය චිකිත්සා, ශල්‍ය, ශාලාක්‍ය, ස්ත්‍රී රෝග හා ප්‍රසූතිතන්ත්‍ර, කෞමාරභෘත්‍ය, දේශීය චිකිත්සා, ස්වස්ථ වෘත්ත, අගදතන්ත්‍ර, ද්‍රව්‍ය ගුණ විඥාන, භෛෂජ්‍ය කල්පනා සහ රස ශාස්ත්‍ර, ශරීර විඥාන හා මෞලික සිද්ධාන්ත හෝ ආයතනයේ හා විශ්වවිද්‍යාලයේ නිර්දේශය පිට කොමිෂන් සභාව විසින් කලින් කළ අනුමත කරන වෙනයම් විශේෂඥ ක්ෂේත්‍රයක් අදහස් වේ;

''සිද්ධ වෛද්‍ය විද්‍යාවේ විශේෂඥ ක්ෂේත්‍රය'' යන්නෙන්, සිද්ධ මරුතුවම්, අරුවයි මරුතුවම්, සිරෝරෝග මරුතුවම්, පෙන් නෝයියෙලුම්, මහාපෙට්රු මරුතුවම්, කුලන්දයි මරුතුවම්, පරම්පරා මරුතුවම්, සමූහ නල මරුතුවම්, නාන්ජියල්, ගුණපාඩම්, සිද්ධ මරුන්තියල් හා සිද්ධ මූලතන්තුවම් හෝ ආයතනයේ හා විශ්වවිද්‍යාලයේ නිර්දේශය පිට කොමිෂන් සභාව විසින් කලින් කළ අනුමත කරන වෙන යම් විශේෂඥ ක්ෂේත්‍රයක් අදහස් වේ;

''යුනානි වෛද්‍ය විද්‍යාවේ විශේෂඥ ක්ෂේත්‍රය'' යන්නෙන්, මෝලිජාත්, ඉල්මුල් ජරාහත්, අම්රාස්-එ-අයින් අන්ෆ් උස්න් වො හලක්, අම්රාස්-ඒ-නිස්වාන් වො කබාලට්, ඉල්මුල් අට්ෆාල්, දේශීය ඉලාජ්, තහෆුසි වො සමාජේ තිබ්, ඉල්මුල් සුමූන්, මුහරබ් අද්වියා, දවාසාසි වො කුෂ්ටාසාසි, තස්රීහ්-එ-බදන් වො මුනෆෙ උල් ආෂා, අල් උමූර් අල්ටබෙයා හෝ ආයතනයේ හා විශ්වවිද්‍යාලයේ නිර්දේශය පිට කොමිෂන් සභාව විසින් කලින් කළ අනුමත කරන වෙනයම් විශේෂඥ ක්ෂේත්‍රයක් අදහස් වේ.

12-806

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.